**2022 ජනවාරි 18 වන දින පැවති ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව**

**කමිටු සාමාජිකයන්**

1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. දුමිඳු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.ඩී.කේ.විනෝදනි විජේසූරිය මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිණීම**

1. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. ඩබ්.එම්.රුවන් විජේසිංහ මහතා - නාගරික කොමසාරිස්
2. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
3. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
4. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපලාන නිලධාරි
5. ජී.වි.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
6. එරික් ප්‍රසන්න මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
7. එම්.ජී.සි.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
8. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
9. රංජිත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීඩා නිලධාරි
10. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
11. අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
12. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණීම**

1. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපලාන නිලධාරි
2. එරික් පි මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
3. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
4. අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක

❖ නාගරික කොමසාරිස්තුමා විසින් ක්‍රීඩා, ආගමික, සංස්කෘතික හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂය සඳහා නව සභාපති තෝරා ගැනිම සඳහා ජන්ද පත්‍රිකා මාර්ගයෙන් සභාපති තෝරා ගැනිම පෙ.ව.10.00 ට සිදු කරන ලදි. කමිටුව සඳහා සහභාගිවූ ගරු නාගරික මන්ත්‍රීවරු 04 දෙනෙකු ලබාදුන් ජන්ද පත්‍රිකා පරික්ෂා කිරිමේදී ජන්ද 03 කින් ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා නව සභාපති ලෙස තේරි පත්විය. මෙම කමිටුවේ ඉදිරි වැඩ කටයුතු කර ගෙන යාම සඳහා නව සභාපති වන ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා වෙත භාර දෙන ලදී.

❖ කමිටුවේ සභාපති ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා විසින් ජන්දය ලබාදුන් සියලුම නාගරික මන්ත්‍රීතුමන්ලාට/මන්ත්‍රීතුමියට ස්තුතිය ප්‍රකාශ කරමින්, ආගමික වතාවත්වලින් පසුව පැමිණ සිටි සියලු දෙනා පිළිගැනිමෙන් අනතුරුව කමිටුවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

1. ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා විසින් ලිපියක් යොමු කරමින් 257 තුලානයේ ක්‍රීඩා පිටි හා උද්‍යාන සියල්ලම තණ කොළ කපා ක්‍රමවත්ව සැකසිය යුතුව ඇත.
   I. පුබුදුබුර 6 වන පටුමගෙහි ඇති ක්‍රීඩාංගන ප්‍රදේශයේ ළමුන්ට සෙල්ලම් කිරිම සඳහා ඔන්චිල්ලාවක් ඇතුළු ක්‍රීඩා උපකරණ කිහිපයක් ලබා දීමට කටයුතු කර දෙන ලෙසත්,
   II. පුබුදුපුර වොලිබෝල් ක්‍රීඩාංගණයේ ඇති ගොඩනැගිල්ල දැනට අබලන්ව ඇත. එය පිළිසකර කර ඉබි යතුරු දමා වගකිවයුතු අයට යතුර භාර දියයුතුය. එහි දැල් වැටේ එති ඇති වැල් ශාඛ කලින් කලට ඉවත් කලයුතුය.
   III. පුබුදුපුර ප්‍රධාන ක්‍රීඩාංගනයේ දැල් වැටෙහි එති ඇති වැල් ශාඛ ගලවා පිට්ටනියේ තණ කොළ කපා ශුද්ධ කළයුතුය.
   IV. ජයසිරිපුර ක්‍රීඩාංගනයේ තණ කොළ කපා ක්‍රීඩා පිටිය අයිනේ ඇති කටු පඳුරු ගලවා එහි ඇති මුල් ඉවත් කළ යුතුය.
   V. 11 වන පටුමගෙහි පිට්ටනිය ශුද්ධ කර සෙල්ලම් උපකරණ කිහිපයක් සවිකර දීමට කටයුතු සලසන්න.
   VI. ජයසිරිපුර බෝධිය අසල ඇති පිට්ටනිය සුද්ධ කර දීමට කටයුතු කරන්න.
   VII. 3 පියවර2 කොටස ග්‍රාම නිලධාරි කාර්යාලය අසල ළමා ක්‍රීඩාංගනය නිසියාකාර සුද්ධ කර දැනට තිබෙන ක්‍රීඩා උපකරණ අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීම.

   මෙම කාර්යයන් කරදීම සඳහා නාගරික ඉංජිනේරුගේ අවධානයට යොමු කිරිමට තීරණය විය

2. මහා නගර සභාවේ ලියාපදිංචි හෝ ලියාපදිංචි කල සෑම කොට්ඨාශයකම සක්‍රීය ක්‍රීඩා සමාජ සඳහා පමණක් ක්‍රීඩා භාණ්ඩ ලබාදීමට සියළු ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය වෙත අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ නම් කර එවන ලෙස ලිපි යොමු කිරිමට තීරණය විය.(වගකිම - පරිපලාන නිලධාරි)

3. කමිටු සභාපතිතුමාගේ යෝජනාවක් අනුව ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය සහ මහා නගර සභාවේ කාර්ය මණ්ඩලය එක්ව සුහද ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමට කල යෝජනාව. ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය සහ මහා නගර සභාවේ කාර්ය මණ්ඩලය එක්ව සුහද ක්‍රිකට් තරගාවලියක් 2022.02.16 දින පැවැත්වීමට තිරණය කරන ලදී. (වගකීම - නාගරික ඉංජිනේරු)

4. ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් මහානාම උයන සමාධි ක්‍රීඩා පිටිය අසල කුඩා ක්‍රීඩා පිටිය වටා ගැඹුරු කාණුවක් කපා තිබෙන බැවින් ක්‍රීඩා පිටියට ඇතුල්වීමට නොහැකි බැවින් ප්‍රවේශවීමට එම ස්ථානයට බෝක්කුවක් යොදා සකස් කර දෙන ලෙස කල ඉල්ලීම.
ස්ථානිය පරික්ෂාවක් කර සකස් කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

5. ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් පුබුදු ළමා උද්‍යානය සහ ළමා ක්‍රීඩා භාණ්ඩ ගලවා සුද්ධ පවිත්‍ර කර පිළිසකර කර දෙන ලෙස කර ඇති ඉල්ලීම. එම ඉල්ලීම ඉටුකරදීමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

6. ඩඩ්ලි සේනානායක උද්‍යානය සුද්ධ පවිත්‍ර කරන ලෙස කල ඉල්ලීම. නගර සීමාවේ සෑම උද්‍යානයක්ම සුද්ධ පවිත්‍ර කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

7. කමිටු සභාපති,ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා විසින් ආරම්භයක් ලෙස කොට්ඨාශ 14 තුල ක්‍රීඩා කටයුතුවල නිරත වන එක් ක්‍රීඩා පිටියකට මහා නගර සභාවේ නම සඳහන් කරමින් ඉදිකිරිමට ජාතික කොඩිය, මහා නගර සභා කොඩිය සහ ක්‍රීඩා සමාජ කොඩිය සඳහා කොඩි කණු 03 ක් ලබාදීමට සුදුසු බව කල යෝජනාව. ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

8. කුම්බිච්චන්කුලම ඇවිදින මංතීරුව සුද්ධ පවිත්‍ර කරන ලෙස කල ඉල්ලීම. නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

   - තවද නුවර වැව මංතීරුව සුද්ධ පවිත්‍ර කිරිම තීරණය කරන ලදී. එහිදි මංතීරුවල කුට්ටි ගල් අතර සෑදි ඇති තණ කොළ ගලවා ඉවත් කිරිමට තීරණය විය. කුම්බිච්චන්කුලම මංතීරුවේ දැනට පවතින තත්ත්වය සලකා බලා නාගරික ජනතාවගේ සුභ සාධන සෞඛ්‍ය කටයුතු ගැන සීතා සුද්ධ පවිත්‍ර කිරිමට තීරණය කරන ලදී.

9. ගරු නාගරික මන්ත්‍රී රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා විසින් ජයන්ති පෙදෙස ක්‍රීඩා කරන ක්‍රීඩා උපදේශකවරුන් සහය ලබා ගන්නා ලෙස කල ඉල්ලීම. පෞද්ගලික අනුග්‍රහක දායකත්වය ඇතුළුව ක්‍රීඩා උපදේශකවරුන්ගේ සහය ලබා ගෙන පාපන්දු ක්‍රීඩාව ඉහල නැන්වීමට කටයුතු කිරීමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

- ඉදිරියේදී පෞද්ගලික අනුග්‍රහක දායකත්වය ලබාදීමට කැමැති ව්‍යාපාරිකයන් හමුවී සාකච්ඡා කිරිමට කමිටු සභාපතිතුමා තීරණය කරන ලදී.

<u>වෙනත්</u>

- මෙම කමිටුවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ක්‍රීඩා නිලධාරි ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගිකර විමට.

- ඉදිරියේදී පෙබරවාරි මස 04 වන දින නිදහස් සැමරුම් උළෙලක් අනුරාධපුර මහා නගර සභා භූමිය තුල සැමරුන් උත්සවයක් පැවත්වීමට කටයුතු කරන ලෙස කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතරන මැතිතුමා යෝජනා කරන ලදී.

ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා
නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,
ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.